# ශ්‍රී ලංකාවේ සිංහල බෞද්ධ නවයෞවනයන් තුළින් ඉවත්ව යන ආගමික සාමාජික සාරධර්ම හා චර්යාධර්ම පිළිබඳ අධ්‍යයනයක්

කොළඹ විශ්ව විද්‍යාලයේ

අධ්‍යාපනය පිළිබඳ දර්ශනපති ( M.Phil )උපාධිය සඳහා ඉදිරිපත් කරන

——— නි බ න් ධ න ය ———


කර්තෘ: එච්. එස්. පතිරණ

බී.ඒ. ගෞරව (දෙවන පෙළ) අධ්‍යාපන ඩිප්ලෝමා (සම්මාන)



UCLIB
386591

PERMANENT REFERENCE NOT TO BE REMOVED FROM THE LIBRARY


ලියාපදිංචි අංකය: 80/ M.Phil /39

උපදේශකාචාර්ය: මහාචාර්ය, යූ.ඩී.ජයසේකර


386591


අධ්‍යාපන පීඨය

කො ළ ඹ  වි ශ්ව  වි ද්‍යා ල ය

1983 - අප්‍රේල් 10

## මෙම නිබන්ධනය පිළිබඳව .......

ශ්‍රී ලංකාවේ නවයොවුන්වියේ පසුවන්නන් තුළින් විවිධ ආගමික සාමාජික සාරධර්ම හා චරියාධර්ම ශීඝ්‍රයෙන් ඉවත් වෙමින් පවත්නේ යයි විවිධ ජනසංනිවේදන මාධ්‍යයන් පවා උපයෝගී කර ගනිමින් සමාජය ඔවුන් වෙත චෝදනා එල්ල කරන්නට යෙදුණේ මෑතක සිට නොවේ. ශ්‍රී ලංකාවේ අනාගත පුරවැසියන් බවට පත්වීමට මෙන්ම, රටේ වගකීම භාර ගැනීමට සිටින මෙම පිරිස තුළින් සමාජය දක්වන තරමටම ආගමික සාමාජික සාර-ධර්ම හා චරියාධර්ම ඉවත්ව යන්නේද? ඉවත්ව යන්නේ නම් ඒ කිනම් සාර-ධර්මයන් හා චරියාධර්මයන්ද? ඒවා ඉවත්ව යාම වළක්වා ගත හැක්කේ කෙසේ-ද යන්න පිළිබඳව මගේ අවධානය යොමු විය. මෙම නිබන්ධනය එහි ප්‍රතිඵලයකි.

මෙහිදී මගේ විශේෂ අවධානය යොමු වූයේ ශ්‍රී ලංකාවේ, පාසල් යන සිංහල බෞද්ධ නවයොවුන් පරපුර වෙතය. එසේ කිරීමට ප්‍රධාන හේතුව වූයේ දත්ත ලබා ගැනීම සඳහා ඇති පහසුවයි. ඒ හැරෙන්නට ලාං-කික නවයෞවනයන්ගෙන් බහුතර පිරිස සිංහල බෞද්ධයන් වීම මගේ අවධානය වඩාත් ඒ වෙතම යොමු කිරීමට හේතු විය. මේ පිළිබඳව ප්‍රමාණවත් කරුණු පළමුවන පරිච්ඡේදයේදී විස්තර වෙයි.

දෙවන පරිච්ඡේදයෙන් නවයොවුන්විය යන්නෙන් අදහස් කරන්නේ කිනම් වයස් මට්ටමක පසුවන්නන්ද යන්න පැහැදිලි කිරීමට උත්සාහ කෙළෙමි. විවිධ පඬිවරුන් විසින් නවයොවුන්වියේ පසුවන්නන් අයත් වන වයස් පරාසයන් පිළිබඳ දක්වන ලද අදහස් සලකා බලමින් කිසියම් නිගමනයකට පැමිණීමට මෙහිදී උත්සාහ දැරුවෙමි.

තෙවන පරිච්ඡේදයේදී ශ්‍රී ලංකාවේ බෞද්ධාගමික සාමාජික සාරධර්ම හා චරියාධර්ම යන්නෙන් අදහස් කරන්නේ කුමක්දැයි සංක්ෂේපයෙන්

පැහැදිලි කරමින් හතර වන පරිච්ඡේදයෙන් නවයොවුන්වියේ පසුවන්නන්ගෙන් අපේක්ෂා කරන ආගමික සාමාජික සාරධර්ම හා චර්යාධර්මයන් මොනවාද යන්න විමසා බැලීමට උත්සාහ දැරීමි.

පස් වන පරිච්ඡේදයේදී නවයොවුන්වියේ පසුවන්නන් තුළින් ඉවත්ව යන ආගමික සාමාජික සාරධර්ම හා චර්යාධර්ම පරීක්ෂා කරමින්, ඒවා ඔවුන් තුළින් ඉවත්ව යාම වළක්වා ගැනීමට යෙදිය යුතු පිළියම් මොනවාද යන්න පිළිබඳව හය වන පරිච්ඡේදයේදී, නිගමන හා යෝජනා යටතේ සාකච්ඡා කෙළෙමි.

විස්තරාත්මක පර්යේෂණ ක්‍රමය මෙම පර්යේෂණයේදී උපයෝගි කර ගත් අතර යෝග්‍ය පරිදි සංඛ්‍යා විද්‍යාත්මක ක්‍රමයන් යොදා ගනිමින් ප්‍රශ්නා-වලි ආදියෙන් ලබා ගත් දත්ත විශ්ලේෂණය කරන්නට යෙදුනි.

නවයොවුන්වියේ පසුවන්නන් සඳහාම යයි වෙන් කරන ලද කිසි-යම් සාරධර්ම හා චර්යාධර්ම ආදියක් බෞද්ධ සාහිත්‍යයේ දක්නට නැත. බුදු-රජාණන් වහන්සේ විසින් හැම වයස් ඛණ්ඩයකටම අයත් ගිහි පැවිදි, ස්ත්‍රී පුරුෂ පිරිස් සඳහා දේශනා කරන ලද විශාල ප්‍රමාණයක් සාරධර්ම හා චර්යාධර්ම ත්‍රිපිටක සාහිත්‍යයේ සඳහන් වෙයි. එයින් බෞද්ධයන්ට වඩාත් හුරුපුරුදු සූත්‍ර කිහිපයකින් ගොනු කර ගනු ලැබූ සාරධර්ම හා චර්යාධර්ම පද්ධතියක්, මේ වෙත අවධානය යොමු කරන්නන්ගේ පහසුව තකා උප ග්‍රන්ථයට ඇතුළත් කළෙමි.

දත්ත ලබා ගැනීම සඳහා නවයොවුන්වියේ පසුවන සිසු සිසුවියන් වෙත ඉදිරිපත් කරන ලද ප්‍රශ්නාවලිය ද උප ග්‍රන්ථයෙහි ඇතුළත් වේ.